# මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

## 2022 දෙසැම්බර් 22 වන දින

❖ **08 වන සැසි වාරයේ 56 වන සභා වාර්තාව**

දිනය :- **2022.12.22** වන දින

වේලාව :- **පෙ.ව.10.00**

ස්ථානය :- **ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. | ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. | ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. | ගරු ප්‍රා.ස.ස. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 04. | ගරු ප්‍රා.ස.ස. ජේ.එල් ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. | ගරු ප්‍රා.ස.ස. පී කොඩිතුවක්කු මැතිතුමා | පෙ.ව. 10.00 |
| 06. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.බී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 07. | ගරු ප්‍රා.ස.ස. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. | ගරු ප්‍රා.ස.ස. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10. | ගරු ප්‍රා.ස.ස. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 11. | ගරු ප්‍රා.ස.ස. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 12. | ගරු ප්‍රා.ස.ස. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව.10. 00 |
| 13. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. | පෙ.ව.10.00 |
| 14. | ගරු ප්‍රා.ස.ස. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව.10.00 |
| 15. | ගරු ප්‍රා.ස.ස. කේ.කේ.ජී. සුමේත්‍රා මැතිතුමිය | පෙ.ව.10.00 |
| 16. | ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව.10.00 |
| 17. | ගරු ප්‍රා. ස. ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව.10.00 |
| 18. | ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව.10.00 |
| 19. | ගරු ප්‍රා.ස.ස. සුගත් සරඹගේ මැතිතුමා. | පෙ.ව.10.00 |
| 20. | ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව.10.00 |
| 21. | ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය | පෙ.ව.10.00 |
| 22. | ගරු ප්‍රා.ස.ස. එන්.ඒ.එස්. වීරසිරි මැතිතුමිය. | පෙ.ව.10.00 |
| 23. | ගරු ප්‍රා.ස.ස. බී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව.10.00 |
| 24. | ගරු ප්‍රා.ස.ස. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය. | පෙ.ව.10.00 |
| 25. | ගරු ප්‍රා.ස.ස. අයි.ජේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා | පෙ.ව.10.00 |
| 26. | ගරු ප්‍රා.ස.ස. ඊ.බී. ඉන්දික මැතිතුමා. | පෙ.ව.10.00 |
| 27. | ගරු ප්‍රා.ස.ස. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය | පෙ.ව 10.00 |

## නොපැමිණි

01. ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා
02. ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා.

## සහභාගී වූ නිලධාරීන්

01. ලේකම් (වැ.බ) - එම්.දිනූජිත් රන්දූල මයා.

02. කළමනාකරණ සේවා නිලධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

## ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු සභිකවරුන් සියළු දෙනා මෙන්ම සහභාගී වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදී. ඉන් පසු, ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස මහ සභා රැස්වීම සඳහා සහභාගි වන ගරු හිටපු සභාපතිතුමන් , ගරු සභිකවරුන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වන ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.

2022 නොවැම්බර් මස 17 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

ගරු ප්‍රා.ස.ස.ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

### ගරු ප්‍රා.ස.ස.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

ගරු සභාපතිතුමණි, පසුගිය සභා වාර්තාවෙහි සංශෝධනය කළ යුතු ස්ථාන කිහිපයක් තියෙනවා. එහි 05 වන පිටුවෙහි සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත යවන කොටස පිළිබඳ අපි කථා කළා. එහිදී සභාවේ දායකත්වය 12%ක් ලෙස සංශෝදනය විය යුතුයි. ඊත් එක්කම මෝසම් සමයේදී සිදුවිය හැකි ආපදා තත්වයන් පිළිබඳ කථා කරද්දි කටුවන රවුම් පාර වර්ෂා කාලයේදී යට වීම සම්බන්ධව මම දිගින් දිගටම කථා කළා. නමුත් ඒ සම්බන්ධව මෙහි සඳහන් වීමක් නැහැ.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

එම සංශෝධනයන් වාර්තාවට ඇතුළත් කරන්න. නිහඬතාවයෙන් පෙනී යන්නේ තවදුරටත් පසුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි. ඒ අනුව 2022 නොවැම්බර් මස සංශෝධිත මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 නොවැම්බර් මස 17 වන දින පැවති සංශෝධිත මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**03. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**04-01.සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත හිඟ දායක මුදල් හා ඊට අදාළ අධිභාර මුදල් ගෙවීම සම්බන්ධව**

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපි මේ සම්බන්ධව පසුගිය සභාවේ තීරණ අංක 05-02 යටතේ කථා කරනු ලැබුවා. එහිදී මේ සම්බන්ධ පරීක්ෂණයකට යටත්ව මෙම අධිභාර මුදල් ගෙවීමට සභාව සම්මත කර ගත්තා. ඒ අනුව එම මුදල් අපි සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත යැවීමට කටයුතු කළා. එම මුදල් එතෙක් නොයැවීම සම්බන්ධව මෙම වාර්තාවේ සඳහන් වෙනවා. අවශ්‍ය සියලු විස්තර එමගින් ලබා ගන්න පුළුවන්.

ගරු ප්‍රා.ස.ස.කේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා

මම මේ වාර්තාව කියවලා බැලුවා. එම වාර්තාවේ ඇතුළත් කරුණු අනුව මේ සම්බන්ධව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලත් වග කියන්න ඕන. මොකද ඒ ආයතනයෙනුත් මෙම උපදෙස් ලබා දෙන්න ප්‍රමාදයක් වෙලා තියෙනවා.නීති උපදෙස් අරගෙන තියෙන්නේ 2021 දී එනම අවුරුදු 06ක වගේ ප්‍රමාදයක් වෙලා තියෙනවා.2015දී මේ ආයතනයෙන් යවපු ලිපියටවත් ප්‍රතිචාර දක්වලා නැහැ. ඒ අවස්ථාවේදී නිවැරදි උපදෙස් ලැබුණා නම් මේ අධිභාර එන්නේ නැහැ. මේ කරුණු සළකා බලද්දී ඒ තැන්වලත් අඩුපාඩු තියන බව පෙනී යනවා.

ගරු ප්‍රා.ස.ස.එම්.ඩී. සුගතදාස මැතිතුමා

ගරු සභාපතිතුමණි, අපි ඉල්ලුවේ මේ කටයුත්තට සම්බන්ධ වූ වගකිව යුතු නිලධාරින් සම්බන්ධව පරීක්ෂනයක් සිදු කරන්න කියලා. මෙම වාර්තාව ඒ සඳහා ප්‍රමාණවත් නැහැ. ඒ අනුව අපි ඉල්ලපු කාරණය මෙතන සිදුකරලා නැහැ. අපි සම්මත කළේ ඒ අනුව ගෙවීම් කරන්න කියලා. මෙතන වංචාවක් වෙලා තියනවද නැද්ද කියන එක පැහැදිලි නැහැ. ඒ නිසා මේ සඳහා අපිට එකඟ වෙන්න බැහැ. මේ සම්බන්ධව එහෙම නම් පළාත් පාලන කොමසාරිස් තුමන්ට හෝ ගරු ආණ්ඩුකාරතුමන්ට දන්වා යවා යම් තීරණයක් අරගන්න අවශ්‍යයි. මේ සම්බන්ධව අපිට වගකියන්න බැහැ.වගකිව යුතු කවුරු හෝ නම් කරන්න ඕන.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඔබතුමන්ලා පසුගිය සභාවේ මේ සඳහා අනුමැතිය ලබා දුන්නා. නැවත එය වෙනස් කරන්න හැකියාවක් නැහැ. අපි මේ මුදල් නොගෙවා තියෙන දින ගණනට අධිභාර ගෙවන්න වෙනවා. ඒ නිසා ගෙවීම කළ යුතුයි.ඒ වගේම මෙම වාර්තාව තුළ මේ සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කරලා තියෙනවා.ඒක මෙම ආයතනය තුළ පමණක් සිදුවුණ සිදුවීමක් නෙවෙයි. පළාත් පාලන ආයතන ඇතුළු බොහෝ රාජ්‍ය ආයතන වල මෙය සිදුවෙලා තියෙනවා.

ගරු ප්‍රා.ස.ස.එම්.ඩී. සුගතදාස මැතිතුමා

ඒ කථාව ඇත්ත වුවත් මෙහෙම කරන්න බැහැ. ඉහළින් යමක් කරන්න අවශ්‍යයි. මේක ආයතනයෙන් කරපු එකක්. එතකොට මෙහි නිවැරදි භාවය පිළිබඳ කොහොමද සෑහීමකට පත්වෙන්නේ?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපි මේ සම්බන්ධව ගිය සභාවේ කථා කරලා තීරණයක් ගත්තා. එහිදී ඉල්ලපු වාර්තාව තමයි මේ ලබා දීලා තියෙන්නේ.පරීක්ෂණයක් කරද්දී මුලින්ම ආයතන ගතව තමයි එය සිදු කරන්නේ.ඒක තමයි ක්‍රමවේදය. ඒ වගේම තීරණයක් අරගෙන ක්‍රියාත්මක වුවාට පසුව ආයෙත් එම තීරණ වෙනස් කරන්න හැකියාවක් නැති බවත් සිහිපත් කරනවා.

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා.

### 05 – 1. 2023 වර්ෂය සඳහා කටුවන ප්‍රාදේශිය සභාව සතු දේපල බදු දීම සම්බන්ධව

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2023 වර්ෂය සඳහා කටුවන ප්‍රාදේශිය සභාව සතු දේපල බදු දීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 84 හා 2022.12.12 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපියට අනුව දෙවරක් ටෙන්ඩර් නොවූ පහත දේපල සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් උපදෙස් ලබාගෙන එම දේපල තවදුරටත් ටෙන්ඩර් නොකර සිටීම සුදුසු යයි යෝජනා කරමි.

01.මිද්දෙනිය නව වෙළදපොළ වැසිකිළිය
02.වැලිපිටිය හිඟුරවැල් ගොඩැල්ල ඉඩමේ පොල් ඵලදාව
03.වැලිපිටිය වත්තගේන ඉඩමේ පොල් ඵලදාව
04.කරමැටිය පොදු වෙළදපොළ වැසිකිළිය

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.බී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා

ගරු සභාපතිතුමණි, මේ දේපල ගිය වර්ෂයෙත් ටෙන්ඩර් වෙලා තිබුණෙ නැහැ නේද?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඔව්, මෙම දේපල ඉල්ලන්නෙ නැති නිසා තවදුරටත් ටෙන්ඩර් කරන්න ඉදිරිපත් කරන එකේ තේරුමක් නැහැ. නමුත් අපිට ආදායමක් අහිමි කරගන්න බැරි නිසා ඒ සම්බන්ධව හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිළධාරි තුමියගෙන් විමසීමක් කරමු. එහෙම නැත්නම් අභ්‍යන්තර විගණන කමිටුවේදී සාකච්ඡාවට යොමු කරලා උපදෙසක් ලබා ගනිමු.

ගරු ප්‍රා.ස.ස.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

පොදු වැසිකිළි සඳහා අපිට සේවකයින් යොදවලා පිරිසිදු කරන්න වෙනවා. කවුරුවත් ගන්නේ නැත්නම් එම නඩත්තු කටයුතු කරන්න අපේ සේවකයින් යොදවන්න වෙනවා.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව සතු දේපල අතරින් 2023 වර්ෂය සඳහා දේපල බදු දීමේදී දෙවරක් ටෙන්ඩර් නොවූ දේපල 04 සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් උපදෙස් ලබාගෙන එම දේපල තවදුරටත් ටෙන්ඩර් නොකර සිටීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

### 05 – 2. 2023 වර්ෂය සඳහා කමිටු පත් කිරීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2023 වර්ෂය සඳහා කමිටු පත් කිරීම මැයෙන් කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම් තුමා විසින් 2022.12.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2023 වර්ෂයට අදාළව පහත කමිටු සඳහා සාමාජිකයින් තෝරා පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

01.මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව
02.කර්මාන්ත හා සේවා කමිටුව
03.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
04.ටෙන්ඩර් කමිටුව
05.පරිසර හා පහසුකම් කමිටුව
06.තාක්ෂණික ඇගයීම් කමිටුව
07.ආගමික සහජීවනය පිළිබඳ කමිටුව

ගරු ප්‍රා.ස.ස.ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි මේ කමිටු සඳහා ගිය වර්ෂයේ සිටි සාමාජිකයින්ම පත් කර ගනිමු. දැනට පුරප්පාඩු වූ මන්ත්‍රී ධුර සඳහා වෙනත් සාමාජිකයින් පත් කර ගන්න. අපේ ගරු ප්‍රා.ස.ස. යූ.ජී.ධර්මසිරි මැතිතුමන් නිවාස හා ප්‍රජා සංවර්දන කමිටුවේ සභාපති ලෙස කටයුතු කළ අතර එතුමන් වෙනුවෙන් එම කමිටුවට ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමත් පත් කර ගනිමු.

<u>ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ඒ යෝජනාව ස්ථිර කරන අතරම ගරු ප්‍රා.ස.ස. චමිල් උදාර මැතිතුමන්ගේ පුරප්පාඩු වූ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ගරු ප්‍රා.ස.ස. ජේ.එල්. ජයන්ත මැතිතුමා සුදුසු බව මම යෝජනා කරනවා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි ඒ සාමාජිකයින් කමිටු සඳහා ඇතුළත් කරමු.

ඒ අනුව 2023 වර්ෂය සඳහා පහත සාමාජිකයින් යුතුව කමිටු පත් කිරීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

01. මුදල් ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

- ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා ( සභාපති)
- ගරු ප්‍රා.ස.ස. කේ.ජී .ප්‍රේමතිලක මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. රමණී හල්පෙගමගේ මැතිතුමිය ( සාමාජික)
- කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම්( සාමාජික)
- ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරි (සාමාජික )
- වවුචර් පරීක්ෂා කරන නිළධාරි ( සාමාජික)
- විෂය භාර නිළධාරි ( සාමාජික)

02. කර්මාන්ත හා සේවා කමිටුව

- ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා ( සභාපති)

- ගරු ප්‍රා.ස.ස. අයි.කේ.සුසන්ත මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. සුගත් සරඹගේ මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. මාතෙල් දිසානායක මැතිතුමිය ( සාමාජික)
- තාක්ෂණ සේවා නිළධාරි ( සාමාජික)
- කර්මාන්ත විෂය භාර නිළධාරි ( සාමාජික)

03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

- ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර මැතිතුමා ( සභාපති)
- ගරු ප්‍රා.ස.ස. ඊ.බී. ඉන්දික මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. සුගත් සරඹගේ මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා ( සාමාජික)
- කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම්( සාමාජික)
- නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන් 01 (සාමාජික )
- ප්‍රජා සංවර්ධන නිළධාරි ( සාමාජික)

04. ටෙන්ඩර් කමිටුව

- ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා ( සභාපති)
- ගරු ප්‍රා.ස.ස. ගාමිණී ජයවික්‍රම මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමිය ( සාමාජික)
- කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම්( සාමාජික)
- තාක්ෂණ සේවා නිළධාරි (සාමාජික )
- සැපයුම් විෂය භාර නිළධාරි ( සාමාජික)
- ආදායම් විෂය නිළධාරි (සාමාජික )
- විෂය භාර නිළධාරි ( සාමාජික)

05. පරිසර හා පහසුකම් කමිටුව

- ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා ( සභාපති)
- ගරු ප්‍රා.ස.ස. කේ.රන්ජන් විරසේකර මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. ඩබ්.ජී. සංජීව මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. එම්.ඩී.සුගතදාස මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ජිනනායක මැතිතුමා ( සාමාජික)
- කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම් ( සාමාජික)
- මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන් 01( සාමාජික)

- තාක්ෂණ සේවා නිළධාරි (සාමාජික )
- සැපයුම් විෂය භාර නිළධාරි ( සාමාජික)
- ආදායම් විෂය නිලධාරි (සාමාජික )
- පරිසර නිලධාරි ( සාමාජික)

06. තාක්ෂණික ඇගයීම් කමිටුව

- ගරු ප්‍රා.ස.ස අයි.කේ.ප්‍රසන්න මැතිතුමා ( සභාපති)
- ගරු ප්‍රා.ස.ස. එම්.පී.සී කැලුම් කුමාර මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. එම්.බී.සුගතදාස මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය ( සාමාජික)
- කටුවන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි ( සාමාජික)
- තාක්ෂණ සේවා නිළධාරි (සාමාජික )
- අදාල ක්ෂේත්‍රයේ රාජ්‍ය සේවයේ නියුතු නිළධාරින් 01 ( සාමාජික)

07. ආගමික සහජීවනය පිළිබඳ කමිටුව

- ගරු ප්‍රා.ස.ස ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා ( සභාපති)
- ගරු ප්‍රා.ස.ස. එච්.ඒ.ගාමිණි සංජීව මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. ජේ.එල්.ජයන්ත මැතිතුමා ( සාමාජික)
- ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය ( සාමාජික)
- වැලිපිටිය විහාරස්ථානයේ වැලිපිටියේ උදිත ස්වාමීන් වහන්සේ ( සාමාජික)
- සංවර්ධන නිලධාරි ඩබ්.එච්.ඒ. ඉන්දික මහතා ( සාමාජික)
- තාක්ෂණ සේවා නිළධාරි (සාමාජික )
- අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය සේවයේ නියුතු නිළධාරින් 01 ( සාමාජික)

<u>**05 – 3, 2023 වර්ෂය සඳහා කසළ කළමණාකරණ සැලැස්ම**</u>

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

කටුවන ප්‍රාදේශිය සභාව විසින් 2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව සකස් කරන ලද කසළ කළමණාකරණ සැලැස්ම අනුමත කිරීම සුදුසු බවත් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස,ජේ.ඒ. ගාමිණී මැතිවුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

හෙල්ලල කසළ අංගනයෙහි කාර්ය භාරය හා කසළ එකතු කිරීම සම්බන්ධව ක්‍රියාත්මක වන සැලැස්ම ඉදිරි වර්ෂයට අදාළව සකස් කරලා තියෙනවා. එය අවශ්‍ය අයට කියවා බලන්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

එක් එක් කාර්යයන්ට අදාළව ක්‍රියාත්මක වන කාලය හා සැලැස්ම මෙහි දක්වා තියෙනවා නේද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, අපි සිදු කරන කාර්යයන් ක්‍රියාත්මක කාල රාමුව අනුව සැලසුම් කරලා තියෙනවා.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව විසින් 2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව සකස් කරන ලද කසළ කළමණාකරණ සැලැස්ම අනුමත කිරීම සම්බන්ධවත් ඒ අනුව කටයුතු කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4. 2023 අභ්‍යන්තර විගණන සැලැස්ම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන ප්‍රාදේශිය සභාව විසින් 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම සුදුසු බවත් එම කාල රාමුව අනුව කටයුතු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙම සැලැස්මත් සෑම වර්ෂයකටම අදාළව ඒ ඒ කාර්යයන් සිදුකරනු ලබන කාලය සඳහන් කරලා නේද සකස් කරලා තියෙන්නේ.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, මේක සෑම වර්ෂයකටම අදාළව සකස් කරනවා.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාවට අදාල 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධවත් එම කාල රාමුව අනුව කටයුතු කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 5. වායු සමීකරණ යන්ත්‍ර සඳහා ක්‍රියාත්මක වූ සේවා ගිවිසුම් අවසන් වීම මත නව සේවා ගිවිසුම් වලට එළඹීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

වායු සමීකරණ යන්ත්‍ර සඳහා ක්‍රියාත්මක වූ සේවා ගිවිසුම් අවසන් වීම මැයෙන් අංක කප්‍රාස 19 හා 2022.12.15 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාවට අයත් මිද්දෙනිය හා කිරම කාර්යාල වල භාවිතා වන වායු සමීකරණ යන්ත්‍ර 12 සඳහා සේවා ගිවිසුම් 2022.11.30 දිනෙන් අවසන් වන බව දන්වා ඇත. ඒ අනුව අදාල නියෝජිත ආයතනයන් සමග එකී සේවා ගිවිසුම් අළුත් කිරීම සුදුසු බවත් එම ගෙවීම් සභා අරමුදලින් ගෙවීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ශක්.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, අපි මේ කාර්යයන් අනිවාර්යයෙන්ම වාර්ෂිකව සිදු කරන්න ඕන. ඒ නිසා එම කටයුතු කරන්න

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාවට අයත් මිද්දෙනිය හා කිරම කාර්යාල වල භාවිතා වන වායු සමීකරණ යන්ත්‍ර 12 සඳහා සේවා ගිවිසුම් 2022.11.30 දිනෙන් අවසන් වන බැවින් අදාල නියෝජිත ආයතනයන් සමග එකී සේවා ගිවිසුම් අළුත් කිරීම සම්බන්ධවත් එම ගෙවීම් සභා අරමුදලින් ගෙවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 6. කිරම නව වෙළඳ සංකීර්ණයේ අංක 07 කඩ කාමරය සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කිරම අංක 07 කඩ කාමරය සම්බන්ධවයි මැයෙන් කිරම, වෙලදගොඩ, මදරා උයන, නො.129 ලිපිනයෙහි පදිංචි ජ්.එම්.සුමිත් චන්දන කුමාර යන අය විසින් 2022.12.14 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඔහුට හිමි කිරම නව වෙළදපොළ අංක 07 කඩ කාමරය ඔහු විසින් මෙතෙක් කරගෙන ආ නමුත් ඉදිරියට කරගෙන යාමේ දුෂ්කරතාවයක් මත ඔහුගේ සහෝදරයාගේ පුතා වන කිරම,නිවාස 20, නො.02 ලිපිනයෙහි පදිංචි ජ්.එම්.මිලිඳු හංෂේන් යන අයට පවරා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව දපපාපපාකො/2010/01චක්‍රලේඛ ප්‍රකාරව එම කඩ කාමරය පවරා දීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.අයි.කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව කිරම නව වෙළදපොළ අංක 07 කඩ කාමරය දපපාපපාකො/2010/01 චක්‍රලේඛ ප්‍රකාරව කිරම,නිවාස 20, නො.02 ලිපිනයෙහි පදිංචි ජ්.එම්.මිලිඳු හංෂේන් යන අයට පවරා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**05 – 7.2023 වර්ෂය සඳහා සකස් කරන ලද පුහුණු හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

පුහුණු හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම මැයෙන් සංවර්ධන නිලධාරි එම්.පී.හේමලතා මිය විසින් 2022.12.15 දිනැතිව ඉදිරිපත් කර ඇති කටුවන ප්‍රාදේශීය සභාවට අයත් 2023 වර්ෂයට අදාළ පුහුණු හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුමත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

මෙහි සඳහන් වෙන්නෙ අපේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණු වීම සම්බන්ධව නේද? ඒත් එක්කම ගරු මන්ත්‍රීවරුන් සඳහා ඇඹිලිපිටිය නායකත්ව පුහුණු ආයතනයෙන් සංවිධානය කරපු දින දෙකක පුහුණුව පසුගිය කාලයේ කොරෝනා වසංගත තත්වයත් එක්ක සිදු කරන්න බැරි වුණා. ඒ පිළිබඳ ගරු සභාපතිතුමා නැවත සොයා බලලා ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කටයුතු කරන්න.

**06. කාරක සභා වාර්තා**

**06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.12.12 වන දින**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022.12.12 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 114 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බවත් යෝජනා අංක 01සිට 06 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා විසින් පැමිණ සිටි කමිටු සාමාජිකයින් පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ආරම්භ කරන ලදී.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 1. | ඩබ්.ඒ.දනිකා සුභාෂණී මිය,යෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනි<br>ය | 2022 සැප්තැම්බර් මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 11990.00 |
| 2. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 සැප්තැම්බර් මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 11250.00 |
| 3. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.10.31සහ 2022.11.08 දිනවල පවත්වනු ලැබූ පාරිසරික තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දීමනාව ගෙවීම | 12000.00 |
| 4. | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව,අංක 15,දුම්රියපොළ පාර,මාතර | කාඩ්බෝඩ් ෆයිල් කවර 700 ක් හා ස්ටේප්ලර් කටු පෙට්ටි 20 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 16160.00 |
| 5. | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව,අංක 15,දුම්රියපොළ පාර,මාතර | ලයිෆ්බෝයි සබන් කැට 500 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 84830.00 |
| 6. | වීරසිංහ හාඩ්වෙයාර්,අංක 79 ඒ,මහ විදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය 4" වෙපර් කෝර්(P.V.C)හා DI 2" වැල් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 132250.00 |
| 7. | සී/ස ගුණවර්ධන සහ (පුද්) සමාගම,මහ විදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• 1" සුදු සෙලෝටේප්(40m) 20-රු 2900.00<br>• හයිලයිටර් පෑන් 10-රු1400.00<br>• මකන 20-රු440.00<br>• 2" බොන්ඩර් ටේප්(40m)-15-රු3750.00<br>• 2" සුදු සෙලෝටේප් (40m)-10-රු2500.00 | 10990.00 |
| 8. | සාමාන්‍යාධිකාරී, සී/ස වී.සේ.සමුපාකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සඳහා 2022.11.01 සිට 2022.11.10 දක්වා ඉන්ධන බිල<br>• 227-5870 - ඩීසල් 125L<br>• RE-9230- ඩීසල් 65L<br>• MG-330- ඩීසල් 250L<br>• RB- 3498 - ඩීසල් 20 L<br>• 252-6508- ඩීසල් 165 L<br>• PF – 7414 - ඩීසල් 118 L<br>• RC- 5539- ඩීසල් - 20L<br>• ZA-2978- ඩීසල් - 40L<br>• BAK – 9907- පෙට්‍රල් - 10L<br>• LK – 9589 - ඩීසල් 90L<br>• ගබඩාව ඩීසල් -360 L | 523695.00 |
| 9. | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව,අංක 15,දුම්රියපොළ පාර,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික ශිල්පීන්ට හා සෞඛ්‍ය කම්කරුවන්ට කහ පැහැති ගම් බූට් 04 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 14400.00 |
| 10. | ලේකම්,නගර සභාව,තංගල්ල | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මිද්දෙනිය බස් නැවතුම්පොළ අසල ඇති වැසිකිළිවල අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් තංගල්ල නගර සභාවේ ගලි බවුසරය සඳහා මුදල් ගෙවීම | 23175.00 |
| 11. | චන්ද්‍රා ස්ටෝර්ස්,අංක 107,කෙලින් විදිය,ගොඩකවෙල | කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | |

| | | | |
|---|---|---|---|
| | | • අඩිරූල් 10-රු450.00<br>• CR පිටු 40 පොත් 20-රු2000.00<br>• CR පිටු 40 පොත් 30-රු6000.00<br>• A4 පැකට් 80-රු200000.00<br>• භාජ්ෂීට් පැකට් 50-රු87500.00 | 295950.00 |
| 12. | මනම්පේරි ස්ටෝර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය ජල/විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම<br>• වයරින් වෙප් රෝල් 100-රු17000.00<br>• 5A වයර් රෝල් 30-රු219750.00<br>• ½" එන්ඩ් කැප් 50-රු2900.00 | 239650.00 |
| 13. | එල්.ඩී.ඩී.දුල්ෂානි මිය,ලක්ෂාන් ඇඩ්වටයිසින්,විරකැටිය පාර,මිද්දෙනිය | නිල මුද්‍රා හා රාජකාරී මුද්‍රා සකස් කිරීමට අදාලව ගෙවීම කිරීම(පොලිමර් මුද්‍රා 12,Flash මුද්‍රා 04) | 9525.00 |
| 14. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා, සූරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | 252-6508 කැබ් රථය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම | 31330.00 |
| 15. | ටී.ටී.ඒ.එම්. පවර් සර්විස්, නො83/17, බිලූ ආර්,ජයසූරිය මාවත,මාතර | LK-9589 අංක දරන ටිපර් රථයේ සිදු කරන ලද අළුත්වැඩියාව සඳහා ගෙවීම කිරීම | 8150.00 |
| 16. | කේ.ඒ.ධම්මික පුෂ්පකුමාර මයා,ධම්මික ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්,ආරුබොක්ක පාර ,කටුවන | කිරම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයට අවශ්‍ය බෙහෙත් තොග ලේඛන මුද්‍රණය කර මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 12000.00 |
| 17. | ජේ.පී.ප්‍රියමාල් හංසන මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 4550.00 |
| 18. | එරංග රවිශාන් මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1400.00 |
| 19. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 20. | කේ.පී.තිළිණි හර්ෂණී මිය, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 21. | එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3700.00 |
| 22. | කේ.ජී.අනුර මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5988.00 |
| 23. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2800.00 |
| 24. | ටී.ජී.මාලා පද්මලතා මිය,සැලසුම් නිළධාරී,නාගරික සංවර්ධන අධිකාරිය | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1570.00 |
| 25. | ටී.ජී.මාලා පද්මලතා මිය,සැලසුම් නිළධාරී,නාගරික සංවර්ධන අධිකාරිය | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1523.00 |
| 26. | එස්.ජේ.ඒ.ගුණරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1900.00 |

| | | | |
|---|---|---|---|
| 27. | කේ.කේ.ජයරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 700.00 |
| 28. | ධර්මදාස රණතුංග මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 700.00 |
| 29. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 10816.00 |
| 30. | ඩබ්.පී.ආර්.ධර්මරංජිත මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 16560.00 |
| 31. | බී.ඒ.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8184.00 |
| 32. | කේ.කේ.ජයරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6338.00 |
| 33. | සහන් චතුරංග මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7837.00 |
| 34. | සමීර මධුසංක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 4658.00 |
| 35. | එම්.එස්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 5533.00 |
| 36. | සහන් චතුරංග මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 4550.00 |
| 37. | එම්.එස්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 4550.00 |
| 38. | එම්.කේ.වී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් | 1950.00 |
| 39. | කුමාර පලිහක්කාර මයා, ,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3187.00 |
| 40. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7931.00 |
| 41. | කේ.එච්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9946.00 |
| 42. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 11316.00 |
| 43. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8515.00 |
| 44. | එම්.ඒ.ලලිත් නිශාන්ත මයා,බවුසර් සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7939.00 |
| 45. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7472.00 |
| 46. | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2952.00 |
| 47. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2143.00 |
| 48. | එස්.පී.අමිල සම්පත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 49. | එම්.ජී.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9332.00 |
| 50. | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 11555.00 |
| 51. | වයි.ජී.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7110.00 |

| | | | |
|---|---|---|---|
| 52. | එම්.අමරශේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7021.00 |
| 53. | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9510.00 |
| 54. | එස්.ජේ.චන්ද්‍රසිරි මයා,මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8472.00 |
| 55. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 56. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8956.00 |
| 57. | ජී.කේ.ජී.ශ්‍රීකාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7621.00 |
| 58. | සුජීව එඩිරිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9249.00 |
| 59. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2337.00 |
| 60. | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6015.00 |
| 61. | අයි.ජී.මංජුල මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3768.00 |
| 62. | කේ.කේ.තාලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 14846.00 |
| 63. | ප්‍රියන්ත ඒකනායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6223.00 |
| 64. | කේ.වී.එම්.රුවිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8207.00 |
| 65. | කේ.ඩී.චතුරංග මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6011.00 |
| 66. | එම්.ගාමිණී මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 4396.00 |
| 67. | එන්.පී.ස්වර්ණා මිය.පුවත්පත් නියෝජිත,කිරම | 2022 ඔක්තෝම්බර් මස වරාපිටිය පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 11660.00 |
| 68. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 69. | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 10000.00 |
| 70. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 14350.00 |
| 71. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 72. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ කාර්යමණ්ඩලයට තේ ලබා දීමට අවශ්‍ය හකුරු පැකට්10 ක්,තේ කොළ 500g පැකට් 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 4920.00 |
| 73. | ඊ.ගයාන් සංජීව මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1760.00 |
| 74. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 940.00 |
| 75. | පෝස්ට් මාස්ටර් ජනරාල්,තැපැල් කාර්යාලය,මිද්දෙණිය | 2022.11.25 දින සිට ඉදිරියට ලිපි තැපැල් කිරීම වෙනුවෙන් තැපැල් ගාස්තු ගෙවීම | 35000.00 |

| | | | |
|---|---|---|---|
| 76. | එෆ්.ඩිලාන් මයා,මීද්දෙනිය පාර,කටුවන | 2022 නොවැම්බර් මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 12790.00 |
| 77. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව මගින් සංවිධානය කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන දෙසැම්බර් මස 05,08,09 යන දිනවල පැවැත්වෙන අතර ඒ සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා ගුරුවරු සඳහා මුදල් ලබා දීමට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 30000.00 |
| 78. | එල්.ඩී.ඩී.දුල්ෂානි මිය,ලක්ෂාන් ඇඩ්වටයිසින්,වීරකැටිය පාර,මීද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,ගරු උපසභාපතිතුමා හා ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලයේ 28 දෙනෙකු සඳහා නාම පුවරු සකස් කිරීමට අදාලව ගෙවීම් කිරීම | 22875.00 |
| 79. | මෙට්‍රෝ කම්පියුටර් ටෙක්නොලජී,අංක 02,කාලිදාස පාර,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• තීන්ත බෝතල්(තීන්ත පෑඩ සඳහා)06- රු1050.00<br>• CR පිටු 200 පොත් 30- රු13350.00<br>• 85A ටෝනර් P1102 05- රු42000.00<br>• Rizo kz 30 INK 05- රු56000.00<br>• තීන්ත පෑඩ 10-රු1950.00<br>• CR පිටු 120 පොත් 20- රු5800.00<br>• LQ 2090 toner Epson 10-රු 52500.00<br>• පැන්සල් 20-රු500.00<br>• HA 107 Toner 05-රු82500.00<br>• A4 පැකට් 04-රු 7000.00 | 262650.00 |
| 80. | සී/ස ගුණවර්ධන සහ (පුද්) සමාගම,මහ වීදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 48100.00 |
| 81. | සාමාන්‍යාධිකාරී,ශ්‍රී ලංකා දුම්රිය සේවය,කොළඹ 10 | 2022 අගෝස්තු මස ඉන්වොයිස් අංක 2022761608 දුම්රිය බලපත්‍ර සඳහා මුදල් ගෙවීම | 15300.00 |
| 82. | ජී.ආර්.රවීනා මෙය, කටුවන. ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස වරිපනම් ප්‍රතිශෝධන කටයුතුවලට සහය වීම වෙනුවෙන් දීමනා ගෙවීම | 32000.00 |
| 83. | එස්.දුෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2700.00 |
| 84. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3160.00 |
| 85. | පී.එස්.පී.කන්ස්ට්‍රක්ෂන්, ගල්පොත්තයාය,ජුලම්පිටිය | හෙල්ලල කසල අංගනය සංවර්ධනය කිරීම 10% රඳවුම් මුදල නිදහස් කිරීම (කසල කළමනාකරණ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම) | 322555.90 |
| 86. | ඩබ්.ඒ.වසන්ත මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් සම හා ඔක්තෝම්බර් මාසවල ජලමනු කියවීම් සඳහා වන ඉන්ධන දීමනාව ගෙවීම (මසකට ඉන්ධන 5L ක් සඳහා) | 3700.00 |

| | | | |
|---|---|---|---|
| 87. | ඔ.ඩී.ඩී.චමිල් මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් සම හා ඔක්තෝම්බර් මාසවල ජලමනු කියවුම සඳහා වන ඉන්ධන දීමනාව ගෙවීම(මසකට ඉන්ධන 5L ක් සඳහා) | 3700.00 |
| 88. | අනෝමසිරි ස්ටෝර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,රන්න පාර,අගුණුකොළපැලැස්ස | 2022.12.06 දින 37.5 kg ගෑස් පිරවූ සිලින්ඩර් 11 ක් සඳහා ගෙවීම් කිරීම | 205150.00 |
| 89. | සාමාන්‍යාධිකාරී, සී/ස වී.එස්.සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සඳහා 2022.11.14 සිට 2022.11.30 දක්වා ඉන්ධන බිල<br>• RE-8995- ඩීසල් 25L<br>• PF – 7414 - ඩීසල් 278 L<br>• 252-6508- ඩීසල් 345 L<br>• RC- 5539- ඩීසල් - 40L<br>• RB- 3498 - ඩීසල් 40 L<br>• RB- 3498 - එන්ජින් ඔයිල්-01 L<br>• RE-9230- ඩීසල් 120L<br>• BAK – 9907- පෙට්‍රල් - 20L<br>• RD- 4364- ඩීසල් - 40L<br>• LK – 9589 - ඩීසල් 130L<br>• 227-5870 - ඩීසල් 214L<br>• 227-5870 – DS40- 01L<br>• MG-330- ඩීසල් 260L<br>• RE-8995- ඩීසල් 60L<br>• HA-4714- ඩීසල් 15L<br>• ZA-2978- ඩීසල් - 260L<br>• 227-5163- ඩීසල් - 100L | 840290.00 |
| 90. | ස්ටාර් ශරන් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,නව නගර පාර,පල්ලේගම,ඇඹිලිපිටිය | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් කිරම උප කාර්යාලයේ ඇති වායු සමීකරණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 25700.00 |
| 91. | එම්.පී.අමරසේන මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් සම හා ඔක්තෝම්බර් මාසවල ජලමනු කියවුම සඳහා වන ඉන්ධන දීමනාව ගෙවීම(මසකට ඉන්ධන 5L ක් සඳහා) | 3700.00 |
| 92. | එම්.එස්.එම්.විජේරත්න මයා,පී.සී.ටෙක්නොලජී,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු UPS 07 ක්, Laptop පරිගණක යන්ත්‍ර 01 ක් හා Desktop යන්ත්‍ර 01 ක් එකක් අළුත්වැඩියා කිරීමට අදාල ගෙවීම් කිරීමට අදාල ගෙවීම් කිරීම | 79050.00 |
| 93. | ජගත් ස්ටෝර්ස්,මහජන පොළ ඉදිරිපිට,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභා පෙර පාසල්වල දූ දරුවන් සඳහා ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 72425.00 |
| 94. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.11.03 සිට 2022.12.05 දක්වා) | 23995.00 |
| 95. | එම්.එස්.එම්.විජේරත්න මයා,පී.සී.ටෙක්නොලජී,වලස්මුල්ල පාර,මිද්දෙනිය | වැටුප් විෂය සඳහා භාවිතා කරන EPSON LQ-2090 ප්‍රින්ටරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 23000.00 |
| 96. | එම්.එස්.එම්.විජේරත්න මයා,පී.සී.ටෙක්නොලජී,වලස්මුල්ල පාර,මිද්දෙනිය | ජල අංශයේ බිල්පත් ලබා ගැනීම සඳහා භාවිතා කරන LQ-209011 ප්‍රින්ටරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 12600.00 |

| | | | |
|---|---|---|---|
| 97. | නිව් සිස්මන් ඉලෙක්ට්‍රිකල්ස්,පළමු පටුමඟ,වීරකැටිය පාර,වලස්මුල්ල | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් හැඩිවත්ත ආදාහනාගාරයේ තිබෙන ජෙනරේටර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 36000.00 |
| 98. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තේ කොළ 500g පැකට් 02 ක්,සුදු සීනි 3kg ,හකුරු පැකට් 09 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 4920.00 |
| 99. | කේ.ආර්.නිශාන්ත මයා,වයිනීස් බීකෝලි හොටෙල්,බස් නැවතුම්පොළ ඉදිරිපිට,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ 2022.11.17 වන දින පැවති මහා සභාවට සහභාගී වූ මහජන නියෝජිතයින් ඇතුළු පිරිසට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම කිරීම | 38880.00 |
| 100. • | එම්.එෆ්.අෆ්පාන් මයා,අංක33,පළමු පටුමඟ,යෝනකපුර,දික්වැල්ල | 2023 වර්ෂය සඳහා බදු නිවේදනය ඉංග්‍රීසි හා දෙමළ භාෂාවලින් පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම | 36395.00 |
| 101. | එම්.එම්පියා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 102. | රෙජිස්ට්‍රාර් ජනරාල්,ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,තංගල්ල | 2019,2020,2021 වර්ෂවලට අදාල මුද්දර ගාස්තු කාර්යමණ්ඩල දීමනා ගෙවීම | 194800.00 |
| 103. | මිතුවෙන මුතු ගොවි සංවිධානය,වීදිපොළ | වීදිපොළ තිත්තලයාය දෙණියකන්ද මාර්ගය සෑස සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම<br>• 10% රඳවුම් මුදල-රු22639.88 | 203758.93 |
| 104. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 නොවැම්බර් මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 12300.00 |
| 105. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 නොවැම්බර් මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 12820.00 |
| 106. | එස්.එම්.හෙවි හයිඩ්‍රොලික්, දුනුමඩලගේන, ගල්පොත්තයාය, ජුලම්පිටිය | ZA-2978 JCB යන්ත්‍රයේ සිදු කරන ලද අළුත්වැඩියාව සඳහා ගෙවීම් කිරීම | 9700.00 |
| 107. | බී.ඩී.ආරියවතී මිය,රෝයල් පාර්ක්, සපුගස්තැන්න පාර,කළගෙඩිහේන | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල 04 සඳහා "දැස අහිමි වූ දියණිය" කෘතිය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 6400.00 |
| 108. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන නගරයේ පවත්වන ලද බිනර අභි වන්දනා තොරණ හා සැණකෙළියෙහි කැන්පත් මුදල් විනෝද බදු ආදායමට ලබා ගැනීම | 80000.00 |
| 109. | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 110. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.11.15 සිට 2022.11.23 දක්වා) | 9890.00 |
| 111. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.11.03 සිට 2022.11.14 දක්වා) | 14720.00 |
| 112. | බී.බී.ජේ.පුෂ්පකුමාර මයා,ජනහිත මෝටර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු සපාරි යතුරු පැදිය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 5450.00 |
| 113. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | PF-7414 කැබ් රථය වාර සේවා සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 31750.00 |

| | | | |
|---|---|---|---|
| 114. | ඊ.සුසන්ත මයා,නිලන්ත මෝටර්ස්, මිද්දෙනිය පාර, කිරම | 252-6508 කැබ් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 71850.00 |

ඉහත වවුචර් අංක 01 සිට 114 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) කටුවන ආදාහනාගාරය,හෙල්ලල කොම්පෝස්ට් ව්‍යාපෘතිය,කටුවන උප කාර්යාලයේ බඩු බාහිර ආදියේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරීම සුදුසු බවත් ප්‍රධාන කාර්යාලයේ හා කිරම උප කාර්යාලයේ දැනට සවි කර ඇති කැමරා පද්ධතිවල දෝෂ නිරාකරණය කර සකස් කර දීම සුදුසු බවත් යෝජනා විය.
2) කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලය,පුස්තකාලය සහ ගබඩාව යන ගොඩනැගිලි තුනෙහි ඇතුළත හා පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම හා ඒ සඳහා අවශ්‍ය තීන්ත මිලදී ගැනීමට සුදුසු යැයි යෝජනා විය.
3) කටුවන ප්‍රාදේශීය සභාවේ ආදේශක,කොන්ත්‍රාත් හා තාවකාලික පදනමින් සේවකයින් 19 දෙනාහට අතිකාල ගෙවීමේදී පැයකට ගෙවනු ලබන අතිකාල මුදල ගණනය කිරීමට දැනට අනුගමනය කරනු ලබන්නේ ඔවුනට ගෙවන දෛනික දීමනාව වන රු 1600.00 ක මුදල, දිනක සේවා කාලය වන පැය 09 න් බෙදා ලැබෙන මුදල වන රු 177.77 ක මුදලයි.නමුත් මෙම සේවකයින් සියලුදෙනාම PL 01,02, හා 03 යන කාණ්ඩවලට අයත් කාර්මික සේවා රාජකාරී කටයුතුවල යොදවා ඇති බැවින් මෙම සේවකයින් වෙත ආදේශක තනතුරේ නිත්‍ය තනතුරට අදාළ වැටුප් කාණ්ඩයේ ආරම්භක වැටුපේ පළමු පියවරට අදාල අතිකාල දීමනාව ගෙවීම සාධාරණ වෙන වඩාත් වාසිදායක බැවින් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව යෝජනා විය.ඒ අනුව PL-01 කාණ්ඩයට අයත් රාජකාරී කටයුතු සිදු කරන කම්කරුවන් ඇතුළු කරන සේවකයින්ට ගෙවිය යුතු දීමනාව ලෙස රු 101.04 ක් ද, PL-02 කාණ්ඩයට අයත් රාජකාරී කටයුතු සිදු කරන තනතුරු නාම අනුව එහි ආදේශක සේවකයින්ට ගෙවිය යුතු දීමනාව ලෙස රු105.2 ක් ද, PL-03 රියදුරු කාණ්ඩයට අයත් ආදේශක රියදුරන් වෙත රු107.45 ක් වශයෙන් ගෙවීම සුදුසු බවත් බහුකාර්ය සහයකයින් අතිකාල සේවයේ යොදවා ගන්නේ නම් ඔවුන්වද නිශ්චිත වැටුප් කාණ්ඩයක් නොවන බැවින් PL-01 කාණ්ඩය ඉහත පරිදි ආදේශ කර ගැනීම සුදුසු බවත් යෝජනා විය.
4) කටුවන ප්‍රාදේශීය සභාවේ රියදුරු(බහුකාර්ය සහයක) ලෙස සේවය කරන ඩබ්.ඒ.ශේහාන ඉරේෂාන් මහතා රියදුරු රාජකාරීවල යොදවා ඇති අතර දැනට පැය 40 ක අතිකාල දීමනාවක් ගෙවීම අනුමත කර ඇති බවත්,නමුත් ඊට අමතරව ගම් වන විට 252-6508 කැබ් රථයේද රාජකාරී පවරා ඇති බැවින් ඔහුගේ අතිකාල දීමනාව පැය 80 ක් දක්වා වැඩි කර දෙන මෙන් ඉල්ලීම කර ඇති අතර ඒ අනුව ඔහු වෙත සභාවේ අනෙකුත් සාමාන්‍ය සේවකයින් වෙත ගෙවනු ලබන ආයතනික අතිකාල සීමාව වන පැය 80 සීමාව තුළත් ඉන් පරිබාහිරව සිදු කිරීමට සිදුවන අතිකාල සේවාවන් පළාත් පාලන සහකාර කොමසාරිස් හා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන ඒ අනුව ගෙවීම කිරීම සුදුසු බවත් යෝජනා විය.
5) සැපයුම්කාර ආයතන හා පාර්ශව වෙත ගෙවිය යුතු බිල්පත් පියවීමේදී ඉදිරිපත් කරනු ලබන ගෙවීම් වවුචර් සඳහා ඇතැම් අවස්ථාවල ඇලවිය යුතු මුද්දර අලවා අත්සන් කිරීමට නොහැකි වූ අවස්ථා නිරීක්ෂණය වීම නිසා,ඒ සඳහා මිල ගණන් පිළිගැනීමේ ලිපිය සමග ගෙවීම් වවුචරය එම ආයතන වෙත යවා අත්සන් කරවා ගැනීම සුදුසු බව යෝජනා විය.
6) වියදම් කළමනාකරණය කිරීමේදී,තැපැල් ගාස්තු සඳහා වැය වන වියදම් අවම කිරීම සඳහා කාර්යාලයේ පැවැත්වෙන කමිටු රැස්වීම් සඳහා කැඳවීම් ලිපි ලියාපදිංචි තැපෑලෙන් යැවීම මේ වන විට සිදු කරන බැවින් ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් ලෙස දුරකථනයෙන් දැනුම් දීම සිදු කර,ලිපි යැවීමට වැය වන මුදල් පාලනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.එය සුදුසු බවට යෝජනා විය.

ගරු ප්‍රා.ස.ස. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මෙම වාර්තාවේ අංක 05-06 යෝජනා වලින් අදහස් කරන්නේ කුමක්ද?

**ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

අපි පසුගිය මුදල් කමිටුවේදී අපිට පරීක්ෂා කිරීමට ලැබෙන ඇතැම් වවුචර් වල මුද්දර අලවා අත්සන් කර නොමැති බැවින් ඒ සඳහා විසඳුමක් විදියට මිල ගණන් පිළිගැනීමේ ලිපිය සමග ගෙවීම් වවුචරය අදාළ ආයතනය වෙත යවලා අත්සන් කරවා ගෙන ගෙන්වා ගැනීමට අපි තීරණයක් ගත්තා. අනෙක් කරුණ විදියට කවුවන ප්‍රාදේශීය සභාවට අදාළව පවත්වන කමිටු සඳහා ඒ ඒ සාමාජිකයින් වෙත දුරකථනයෙන් මේ පිළිබඳ අදාළ දිනයන් දැනුම් දීම කරනවා. ලියුම් තැපැල් කිරීමෙන් අපි විශාල මුදලක් තැපැල් ගාස්තු වශයෙන් ගෙවන්න ඕන. අපි ඒක අවම කරන්න තමයි මේ ක්‍රමය භාවිතා කරන්නේ. ඒ පිළිබඳ සියලු දෙනාම දැනුවත් වෙන්න.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**

අපිට මේ සඳහා එක් එක් කමිටු වලට වට්ස්ඇප් පණිවුඩයක් දෙන්න පුළුවන් ක්‍රමයක් සකස් කරන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි ලබන වර්ෂයේ කමිටු වල සිටම ඒ ඒ විෂය භාරව අදාළ කමිටුවට අදාළ වට්ස්ඇප් කණ්ඩායමක් සකස් කරලා ඒ පණිවුඩය ලබා දෙන්න කටයුතු කරන්නම්. ඊට අමතරව දුරකථන ඇමතුමක් මගින් පණිවුඩය ලබා දෙනවා.

ඒ අනුව අංක 01 සිට 114 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සිට 06 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 නොවැම්බර් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ නොවැම්බර් මස මෙම සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.521 310.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 58 151.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.463 159.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ජ්.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 නොවැම්බර් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 නොවැම්බර් මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:1545800.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,රියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු:794932.00 ක වියදමක් දරා ඇත.

එමෙන්ම මෙම යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් රු:750868.00 ක අලාභයක් සිදු වී ඇත. එම වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 නොවැම්බර් මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 නොවැම්බර්

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා නොවැම්බර් මස රු.1 388 645.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 නොවැම්බර් මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විරුද්ධ අදහස් නොමැති බැවින් සියලු සභිකවරුන්ගේ ඒකගතාවය මත සභා සම්මත කරන ලදි.

## 06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මස

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2022 සැප්තැම්බර් මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 1 974 919.68 වන අතර මාසික වියදම රු.1 242 711.98ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 732 207.70කි.

2022 ඔක්තෝම්බර් මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 2 211 310.02 වන අතර මාසික වියදම රු.3 331 763.07ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 1 120 453.05 කි. ඒ අනුව සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසයන්ට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ජේ.ජී. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඒත් එක්කම අපි ගිය සභාවේ අනුමැතිය ලබා ගෙන කැකිරිඔබඩ ප්‍රජා ජල ව්‍යාපෘතිය මේ දිනවල සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබනවා. ඒ සඳහා ජල පාරිභෝගිකයින්ගෙන් ගිවිසුම් අත්සන් කරන අතර ඒ සඳහා ගාස්තුවක් නියම කර ගන්න වෙනවා.

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

අපිට විශාල මුදලක් මේ අයගෙන් අය කරන්න අවශ්‍ය නැහැ. අපි රු.1500.00ක් වැනි මුදලක් කරමු.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

දැනට අපේ නිලධාරින් මේ සංවිධානය සතු වත්කම් පරීක්ෂා කරලා ඒවා පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරලා තියෙන්නේ. ඒ සඳහා ගිවිසුම් ගාස්තුව රු. 1500.00ක් අය කරමු.

ඒ අනුව 2022 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා අනුමත කිරීම සම්බන්ධවත් කැකිරිඔබඩ රන්දිය දහර ප්‍රජා මූල සංවිධානය ප්‍රාදේශීය සභාව වෙත පවරා

ගැනීමේ ගිවිසුම් ගාස්තුව ලෙස රු.1500.00ක මුදලක් අය කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම - 2022 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 සැප්තැම්බර් මස වන විට ආරම්භක හිඟය රු: 6 163 809.08ක් වන අතර එම මස අවසාන හිඟය රු: 5 880 501.08 ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 283 308.00ක් වන අතර හිඟය අඩු වී ඇත. එසේම 2022 ඔක්තෝම්බර් මස වන විට ආරම්භක හිඟය රු: 5 880 501.08ක් වන අතර ඔක්තෝම්බර් මස අවසාන හිඟය රු: 5 135 306.08ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 745 195.00 ක් වන අතර හිඟය අඩු වී ඇත.මෙම වාර්තා සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ජේ.ජී. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස ජේ.එල්.ජයන්ත මැතිතුමා.**

මෙම ජල ගාස්තු සකස් කිරීමේදී ස්ථාවර ගාස්තුව එකිනෙකට වෙනස් වෙන විදියට නේද සකස් කරලා තියෙන්නේ?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි ඔය ගාස්තු යම් යම් ගැලපීම් කරලා තමයි සකස් කරලා තියෙන්නේ. ඒ නිසා මෙතන සේවා ගාස්තුවක් විදියට තමයි සදහන් කරලා තියෙන්නේ.

**ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අපි මේ ජල ගාස්තු වෙනස් වන ආකාරය පිළිබඳ ජල පාරිභෝගිකයින් දැනුවත් කරන්න පුළුවන් නම් හොදයි.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස වල මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 7. කර්මාන්ත කමිටු වාර්තාව - 2022 .12.14 වන දින

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022.12.14 වන දින පැවති කර්මාන්ත කමිටු වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී 2022 වසරේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත කර්මාන්ත වල ඉදිකිරීම් ප්‍රදානය පිළිබඳ සාකච්ඡා කරන ලදී.

01. බෙංගමුකන්ද ගයාවුන් මාවත සහ උඩ බංගලාව,මැදකන්ද දොළොස්දෙණිය මාර්ගය කාපට් සකස් කිරීම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු බෙංගමුකන්ද ගොවි සමිතියට ලබා දීම සුදුසු බව
02. මිද්දෙණිය උතුර නව ජල පොම්පාගාරයේ ඉදිකිරීම මිද්දෙණිය උතුර පුබුදු ගොවි සමිතියට ලබාදීම සුදුසු බව
03. එගොඩබැද්ද වරාපිටිය මාර්ගයේ ආරම්භක ස්ථානයේ පැති බැම්ම ඉදිකිරීම එගොඩබැද්ද ආදර්ශ ගොවි සමිතියට ලබා දීම සුදුසු බව

04. කිරිවානගොඩ අලුත්පාර සකස් කිරීම පංගම්විලයාය මයුර ගොවි සමිතියට ලබාදීම සුදුසු බව
05. දයානන්ද මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය කොන්ක්‍රීට් කර සකස් කිරීම කර්මාන්තයේ ඉදිකිරීම හඳුගල ගැමුණු ගොවි සමිතියට ලබාදීම සුදුසු බව
06. කැකිරිඹබඩ පුස්කොලයාය මාර්ගයේ පුස්කොළයාය කැඩී ඇති බෝක්කුව අසල පැති බැම්ම ඉදිකිරීම කැකිරිඹබඩ දිමුතු ගොවි සංවිධානයට ලබා දීම සුදුසු බව
07. පහළ අළුපොත්දෙණිය දමේලන්ද මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ ඉදි කිරීම පහළ අළුපොත්දෙණිය මහසෙන් ගොවි සමිතියට ලබාදීම සුදුසු බව මෙදින කමිටුව තීරණය කරන ලදී.
08. 2021 ප්‍රධාන ලේකම් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද හඳුගල ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම කර්මාන්තයේ වැඩ අවසන් කර බිල්පත ඉදිරිපත් කර තිබූ අතර එහි ගෙවීම කිරීම සුදුසු බව සහ කවුඩන ජාතික පාසල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රඳවුම නිදහස් කිරීම සුදුසු බවද මෙදින පැවති කමිටුව තීරණය කරන ලදී.
09. මුරුංගස්යාය කොටියාගයේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා දඹේකලාව ගොවි සමිතියට ලබාදීම සුදුසු බව
10. පිස්සුබැද්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම කර්මාන්තයේ ඉදිකිරීම පිස්සුබැද්ද රන්කෙත ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව මෙදින පැවති කමිටුව තීරණය කරන ලදී.

ගරු ප්‍රා.ස.ස.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.12.14 දින පැවති කර්මාන්ත කමිටු වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 14,16,07 වාර්ථා

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 14,16 ,07 ආදායම් අයකර ගැනීම හා හිග ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
    1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
    2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
    3. 0072633606- කර්මාන්ත ගිණුම
    4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
    5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
    6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 නොවැම්බර් මස ප්‍රා.ස. 16 ,14,07 වාර්තා

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 නොවැම්බර් මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16,14,07 වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලූ සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මත ඒකමතිකව සභා සම්මත විය.

:

## 08. වෙනත් යෝජනා

## 08-8. වවුචර් සඳහා ගෙවීම කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් සඳහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 964 -මුදල් භාරකරු- පහළ අළුපොත්දෙනිය දශබිලන්ද මාර්ගය කපා සකස් කිරීම- රු.208815.01

02. වවුචර් අංක 988 - මුදල් භාරකරු - සභාව සතු 252-6508 කැබ් රථය ධාවනයේදී සිදු වූ හදිසි අලුත් වැඩියාව සඳහා ගෙවීම - රු.14500.00

03. වවුචර් අංක 191 - ඊ.සුසන්ත - සභාව සතු KK9589 ටිපර් රථය අලුත් වැඩියා කිරීම රථය අලුත් වැඩියාව සඳහා ගෙවීම - රු.6850.00.

04. වවුචර් අංක 968 - මැල්ලකැටිගොඩ ගොවි සංවිධානය - මිද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම කොටස කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රැඳවුම් මුදල් නිදහස් කිරීම - රු.49444.77

05.වවුචර් අංක 967 - ජනක් ග්‍රොසරීස්, මහජන පොළ ඉදිරිපිට, මිද්දෙනිය - කටුවන ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් වල සිසුන් සඳහා ආහාර ලබා දීමට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම- රු.69350.00

06. වවුචර් අංක 983 - ජේ.ඒ. ප්‍රසන්න මධුශංක, මයි ප්‍රින්ටින් ආයතනය, විරකැටිය පාර, මිද්දෙනිය - 2022 ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා ප්‍රශ්න පත්‍ර කට්ටල මුද්‍රණය කිරීම - රු.113800.00

07.වවුචර් අංක 984 - ජේ.ඒ. ප්‍රසන්න මධුශංක, මයි ප්‍රින්ටින් ආයතනය, විරකැටිය පාර, මිද්දෙනිය - 2022 ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා හාෆ්ෂීට්, ෆයිල් කවර ආදිය මිලදී ගැනීම - රු.82800.00

08. වවුචර්.අංක 292 - කේ.එස්. ගුණදාස- කටුවන ප්‍රාදේශීය සභාවේ වරාපිටිය පුස්තකාලය සඳහා ලබාදුන් කඩ කාමරය වෙනුවෙන් 2022 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා වූ මාස 12ක කාල සීමාවකට අදාළ බදු කුලී ගෙවීම - .රු.34200.00

09. වවුචර් අංක 888 - ජේ.ඒ.අනුර කුමාර ,අනුර හයිඩ්‍රොලික් හෝස් සර්විස්, විරකැටිය - ZA 2978 JCB යන්ත්‍රයේ ½ හයිඩ්‍රොලික් හෝස් එකේ වැඩ නිම කිරීම.-රු.8350.00

10. වවුචර් අංක 192 -ලංකා විදුලි බල මණ්ඩලය, වැලිපිටිය අවකාශ ඉඩමේ ජල පොම්පාගාරය සඳහා විදුලිය ලබා ගැනීමේ ඇස්තමේන්තු මුදල් ගෙවීම - - රු.50615.00

11. වවුචර් අංක - එම්.එස්.එම්.විජේරත්න, P.C. Technology, වලස්මුල්ල පාර, මිද්දෙනිය- කටුවන සභාව සතු UPS යන්ත්‍ර 7ක් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 01ක් හා Decktop යන්ත්‍ර අලුත්වැඩියා අලුත්වැඩියා කිරීම - රු.79050.00

12. වවුචර් අංක 193 - එස්.ඒ.ජී.පුෂ්පකුමාර, මිද්දෙනිය උතුර ජල පොම්පාගාරය සඳහා විදුලිය ලබා ගැනීමට වයරිං විදුලි ඉංජිනේරු වාර්තාව ලබා ගැනීම සඳහා මුදල් ගෙවීම - රු.18000.00

13. වවුචර් අංක 982 -සාමාන්‍යාධිකාරි, සී/ස වී.සේ. සමුපකාර සමිතිය, කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ඉන්ධන ලබා ගැනීම. – 468300.00

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් සඳහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-2. මාර්ග සංවර්ධනය කිරීමට අදාළ සාධාරණීකරණ වාර්තා සඳහා අනුමැතිය ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

2021 ස්ථාවර වත්කම් සමීක්ෂණයේ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාව වෙත ඉදිරිපත් කිරීම මැයෙන් අංක කප්‍රාස /සං/36/02/ස්.ව. හා 2022.12.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2021 වර්ෂයට අදාළ ස්ථාවර වත්කම් සමීක්ෂණයේ පහත නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර කමිටුව මගින් ඉදිරිපත් කර ඇති එම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු යයි යෝජනා කරමි.

<u>ස්ථාවර වත්කම් සම්බන්ධ කමිටු නිරීක්ෂණ</u>

01.පොදු කටයුතු සඳහා ලබා දී ඇති ඉඩම් වල් බිහි වී ආවරණ වැටකින් තොරව පැවතීම

02.අයිතිය තහවුරු කරන නාම පුවරු යොදා නොතිබීම

03.සභාව පරිහරණය කරනු ලබන ඇතැම් ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය නොමැති වීම

04.සභාව වෙත පවරා ඇති ප්‍රජා ශාලාවල නීත්‍යානුකූල අයිතිය ලබා දී නොතිබීම

05.සභාව වෙත ලබා දී ඇති සුසාන භූමි වල නීත්‍යානුකූල අයිතිය ලබා දී නොතිබීම

06.සභාව සතු ඇතැම් ඉඩම් වල මායිම් නිවැරදිව හඳුනාගත නොහැකි වීම

07.පෙර වර්ෂයන්හි ස්ථාවර වත්කම් සමීක්ෂණයන්හි වාර්තාවන්ට ඇතුළත් නොවූ සභාව සතු ඉඩම් හා ක්‍රීඩා පිට්ටනි දක්නට ලැබීම

<u>ස්ථාවර වත්කම් සම්බන්ධ කමිටු නිර්දේශ</u>

01.සභාව සතු නෛතික අයිතිය නොමැති වත්කම් වල නෛතික අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කිරීම

02.සභාව සතු දේපලක් බවට තහවුරු කෙරෙන දැන්වීම් පුවරු ප්‍රදර්ශනය

03.දැනට මායිම් වැටවල් සකස් කර නොමැති ඉඩම් වල මායිම් වැට සකස් කර ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම

04.වෙනත් ආයතන මගින් ගොඩනැගිලි ගලා දීමේදී එම ගොඩනැගිල්ල පිහිටි භූමියේද නෛතික අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීම.

05.සභාව වෙත ලබා දී ඇති සුසාන භූමි වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

06.ඉඩම් වෙන්දේසි කිරීම වෙනුවෙන් සභාව වෙත ලබා දී ඇති මායිම් නිවැරදිව හඳුනාගත නොහැකි ඉඩම් වල මායිම් නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම.

07පෙර වර්ෂයන්හි ස්ථාවර වත්කම් සමීක්ෂණයන්හි වාර්තාවන්ට ඇතුළත් නොවූ සභාව සතු ඉඩම් හා ක්‍රීඩා පිට්ටනි පිළිබඳ තොරතුරු විධිමත්ව ලේඛනගතව ඇත්දැයි සොයා බැලීම.

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා.

ගරු සභාපතිතුමණි, මේ නිර්දේශ ලබා දී ඇත්තේ මෙම වර්ෂයට අදාළව සිදු කරනු ලබන ස්ථාවර වත්කම් සමීක්ෂණයද?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.

නැහැ. මේ 2021 වර්ෂයේ සමීක්ෂණ වාර්තාව. 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා ඉදිරි මාසයේදී ස්ථාවර වත්කම් සමීක්ෂණ සිදු කරනු ලබනවා.

ඒ අනුව 2021 වර්ෂයට අදාළ ස්ථාවර වත්කම් සමීක්ෂණයේ නිර්දේශිත තීරණයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-3 .වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම- 2023

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.

2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මැයෙන් සංවර්ධන නිලධාරී ජී.එච්. හේමමාලි මිය විසින් 2022.12.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.

මෙම සැලැස්ම තුළ අපි ලබන වර්ෂයේ සිදු කිරීමට යෝජිත සංවර්ධන කටයුතු මෙන්ම ජනතා සුභසෙත සඳහා සිදු කරනු ලබන සියලු වැඩසටහන් අදාළ කාල රාමුව සමග ඉදිරිපත් කරලා තියෙනවා.

ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08- 4 .කිරම විද්‍යුත් පුස්තකාලයේ භාවිතා කරනු ලබන CPU 04ක් අලුත්වැඩියා කිරීම

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

කිරම විද්‍යුත් පුස්තකාලයේ භාවිතා කරනු ලබන CPU 04 ක් රෙපෙයාර් කිරීම මැයෙන් අංක කප්‍රාස 19 / කාර්යාල තඩත්තු හා 2022.12.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2021 භාණ්ඩ සමීක්ෂණයේ හඳුනා ගත් පරිදි කිරම උප කාර්යාලයේ භාවිතයට ගන්නා CPU 04 ක් අක්‍රියව පවතින බැවින් එය අලුත් වැඩියා කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගෙන අවශ්‍ය කටයුතු සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

මේ CPU 04 ඉක්මණින් අලුත් වැඩියා කර ගනිමු.

ඒ අනුව 2021 භාණ්ඩ සමීක්ෂණයේ හඳුනා ගත් පරිදි කිරම උප කාර්යාලයේ භාවිතයට ගන්නා CPU 04 ක් අක්‍රියව පවතින බැවින් තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගෙන අවශ්‍ය කටයුතු සහා අරමුදලින් සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-5. කිරම බස් නැවතුම්පොළ උඩු මහලේ කොටසක් බදු දීම සම්බන්ධව

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

කිරම බස් නැවතුම්පොළ උඩු මහලේ ශාලාවක් ලබා ගැනීම මැයෙන් කිරම , මාපිට කන්ද, නො.46 ලිපිනයෙහි පදිංචි ආර්.ඒ.ඒ.මංජුල යන අය විසින් 2022.12.22 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කිරම බස් නැවතුම්පොළ උඩු මහලේ කොටසක් බදු පදනම මත ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව ආදායම් පරීක්ෂක වාර්තාවක් මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් ලබා ගෙන ඔහුට අවශ්‍ය ප්‍රමාණය බදු කුලිය මත ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. අයි.කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා.**

බස්නැවතුම්පොළ උඩු මහල දැනට භාවිතා කරන්නේ නැති නිසා එහෙම අවශ්‍ය කෙනෙකුට දෙන එක හොඳයි.

ඒ අනුව කිරම බස් නැවතුම්පොළ උඩු මහලේ කොටසක් බදු පදනම මත ලබා දීම සඳහා ආදායම් පරීක්ෂක වාර්තාවක් මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් ලබා ගෙන අවශ්‍ය ප්‍රමාණය බදු කුලිය මත ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-06. ගල්පොතුකන්ද පෙර පාසලට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

පෙර පාසලට අවශ්‍ය කරන ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධවයි මැයෙන් ගල්පොතුකන්ද පෙර පාසලේ කේ.කේ.සුනීතා මිය විසින් 2022.12.19 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පෙර පාසල සඳහා ඉල්ලුම් කර ඇති පහත උපකරණ මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

01. කැසට් යන්ත්‍ර - 01

02.අල්මාරි - 01

03.ගුරු මේස - 01

04.ගුරු පුටු - 01

05.බංකු සෙට් - 01

06.ප්ලාස්ටික් පුටු - 06

ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා**

අපි ඒ භාණ්ඩ මිල කැඳවීම් කරලා අරගෙන දෙමු.

ඒ අනුව ගල්පොතුකන්ද පෙර පාසල සඳහා ඉල්ලුම් කර ඇති උපකරණ මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-7. ප්‍රචාරක කටයුතු සඳහා අවසර ලබා ගැනීම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ප්‍රචාරක කටයුතු සඳහා අවසර ලබා ගැනීම මැයෙන් කටුවන නව වෙළඳ සංගමය විසින් 2022.12.22 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන නව වෙළඳ සංගමය විසින් සිංහල අලුත් අවුරුද්ද සඳහා පහත මාර්ග ආවරණය වන පරිදි වෙළඳ ප්‍රචාරක වැඩ සටහනක් කිරීමට සැලසුම් කර

ඇති බව දන්වා ඇත.එම කටයුතු දින 07ක් තුළ සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

01.කටුවන උඩ ගොමඩිය පාර - පොලිසිය දක්වා

02.කටුවන රැක්මල්පිටිය පාර - පාසල දක්වා

03.කටුවන මිද්දෙනිය පාර - රෝහල පසුකර

04.කටුවන වලස්මුල්ල පාර - ආඩියවත්ත දක්වා

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කටුවන නව වෙළඳ සංගමය විසින් සිංහල අලුත් අවුරුද්ද සඳහා කටුවන නගරය තුළ අදාළ මාර්ග ඔස්සේ වෙළඳ ප්‍රචාරක වැඩ සටහනක් දින 07ක් තුළ සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-8. 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන වාර්තාව අනුමත කිරීම**
**ගරු ප්‍රා.ස.ස. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා.**

2023 ප්‍රසම්පාදන සැලැස්ම මැයෙන් සංවර්ධන නිලධාරී ඒ.ගයාන් සංජීව මයා විසින් 2022.12.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මේකත් වාර්ෂිකව අනුමත කර ගත යුතු සැලැස්මක් . ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න

ඒ අනුව 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-09. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු උප සභාපතිතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-10. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ස. එච්.කේ.ඒ.ආනන්ද කුලසුන්දර මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ස. එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු ප්‍රා.ස.ස. එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>09.ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>**

**<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය වට රවුම අපි තැවත අලංකාර පැළ වලින් විසිතුරුව සකස් කරලා තියෙනවා. නමුත් ඒ වටා කොඩි ගැසීමෙන් සහ ස්ටිකර් සවි කිරීමට යාමෙන් එම පැළ වලට හානි පැමිණෙනවා. ඒකට විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි එතන එම කටයුතු වලින් පැළ වලට සිදු වන හානිය හේතුවෙන් එම කාර්යයන් නතර කරන්න කියලා බෝඩ් එකක් සවි කරමු .

**<u>ගරු ප්‍රා.ස.ස එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, පුවක් ගස් ආර, බීන්තැන්න මාර්ගය බෝක්කුවක් යොදා සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.ස ආරියරත්න ඒකනායක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අපේ සභා බල ප්‍රදේශය තුළ බොහෝ මාර්ග ශුද්ධ කරන්න අවශ්‍යයි. ප්‍රධාන මාර්ග අවට පවා විශාල වශයෙන් ගස් වැවී තිබීමෙන් පාරේ යන අයට සහ වාහන වලට දුෂ්කරතා වලට මුහුණ දෙන්න වෙනවා. මේ මාර්ග වල දෙපස ශුද්ධ කිරීම කරන්න ඕන.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යවමු.

**<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, පසුගිය දිනක මීට පෙර අපිත් සමග ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ වීර මන්ත්‍රීතුමන් අභාවයට පත් වුණා. එතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන්න මම මේ අවස්ථාව යොදා ගන්නා. ඒත් එක්කම අපි මීට පෙර මන්ත්‍රී ධූරයේ සිටි ධූර කාලය තුළ අපිට යතුරු පැදි ලබා දුන්නා. දැනට ඒ යතුරු පැදි අප වෙත පවරා ගත යුතුයි. නැත්නම් අපිට ඒ සම්බන්ධයෙන් කිසිදු අයිතියක් නැහැ. අපිට මේ යතුරු පැදි අපේ නමට පවරා ගන්න කටයුතු කරනවා නම් හදිසි අවස්ථාවක එය ප්‍රයෝජනවත් වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ස ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා</u>**

පසුගිය කාලයේ ලැබුණු යතුරු පැදි අපිට පවරා ගන්න පුළුවන්. ඒ සඳහා අපි අදාල ලිපි ලේඛන මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත භාර දෙන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

ඔව්, අපිට එහිදි තියන ගැටළුව තමයි මේ යතුරු පැදි සඳහා මුදල් බදින ලද කුවිතාන්සි පනෙහි පිටපතක් අවශ්‍ය වෙනවා. අපි මේ යතුරු පැදි ප්‍රාදේශියසභාව හෝ ලේකම් කාර්යාල හරහා ලබා නොගත් නිසා එම ලේඛන හොයන්න අපහසුයි. මේ සම්බන්ධ ලිපි ගොනු සභාව තුළ පවතිනවාද? ගරු සභාපතිතුමා මේ සම්බන්ධව සොයා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

අනෙක් කාරණය විදියට මහින්ද නාහිමි මාවතෙහි පාර දෙපස විශාල වශයෙන් බැද්ද වැවීම නිසා මාර්ගය අවහිර වෙලා තියෙනවා. ඒ සඳහා සභාවේ වාහන ටික යොදවලා ගමේ මිනිස්සුත් යොදා ගෙන ශ්‍රමදානයක් කරනවා නම් මේ කාර්යය පහසුවෙන් සිදු කරන්න පුළුවන්.ඒත් එක්කම මීද්දෙනිය නගරයේ සවි කර ඇති ඩිජිටල් නාම පුවරු ඉවත් කිරීම තවමත් සිදු කරලා නැහැ. මෙම සම්බන්ධයෙන් කිහිප වතාවක් කථා කළත් ඒ සඳහා අවශ්‍ය පියවර අරගෙන නැහැ.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි මේ සම්බන්ධව නැවත විදුලි බල මණ්ඩලයට දැනුම් දෙමු.

<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ඒත් එක්කම ගරු සභාපතිතුමණි, කටුවන සභා බල ප්‍රදේශය තුළ ළමුන්ට සෙල්ලම් කිරීමට සුදුසු උද්‍යානයක් කිසිදු තැනක ඉදිකර නැහැ. නමුත් මීද්දෙනිය වැව ආශ්‍රිත රණවිරු උයන ආශ්‍රිතව හෝ සෝරකොළ යාය ඇගලුම් කර්මාන්තය අසළ සභාව සතු ඉඩම අපිට මෙවැනි කටයුත්තක් සඳහා යොදවා ගන්න පුළුවන්. ඒ වගේම රණවිරු උද්‍යානයේ සවිකර ඇති උපකරණ කැඩී බිඳී ගොස් ඇති ඒවා අලුත්වැඩියා කිරීම සිදු කළ යුතුයි.ප්‍රවේශ වන මාර්ගයද යම් අබලන් තත්වයක පවතින බැවින් එයද පිළිසකර කළ යුතුයි.

<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>

රණවිරු උයන ආශ්‍රිතව විදුලිය නොමැති වීමත් ගැටළුවක් . විදුලිය තියනවා නම් එතන රාත්‍රී කාලයට වුවත් බොහෝ දෙනෙක් පැමිණෙනවා. ඒ වගේම මීද්දෙනිය වට රවුමේ විදුලි කණුව එතනින් ඉවත් කරලා දෙන්න කියලා කිහිප වතාවක් ඉල්ලීම් කළත් තවමත් එය ඉටුවෙලා නෑ.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒ සම්බන්ධව අපි විදුලි බල මණ්ඩලය දැනුවත් කරලා තියෙනවා.

<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

අපි මේ හමුවුණ 2022 දෙසැම්බර් මස මහ සභාව මේ වර්ෂයේ අවසාන මහ සභාව වගේම ඉදිරි මාසයේදී අපි සභාවක් විදියට හමුනොවෙන්නත් පුළුවන්. කෙසේ නමුත් ගරු සභාපතිතුමන් සමග එක්ව අපි මේ වසර 05ට ආසන්න කාලය තුළ ඉතා වගකීමෙන් කටයුතු කළා. එතුමන්ලා ජනතා සුභ සෙත සඳහා සිදු කරන්න යෝජිත සියලුම සංවර්ධන කටයුතු සඳහා මුදල් පිළිබඳ විමසීමක් නොකර ජනතා සුභ සිද්ධිය වෙනුවෙන් අපිට හැකි උපරිම සහයෝගය ලබා දුන්නා.ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් අවශ්‍ය සහයෝගය ලබා දෙමින් සෑම කාර්යයකටම පාගේ දායකත්වය ලබා දුන්නා. ඉදිරි වර්ෂයේදීත් ජනතාවට සේවය කරන්න පුළුවන් හොඳ අයවැයක් සකස් කරලා තියෙනවා. එම කටයුතු සාර්ථකව සිදු කරන්න අවශ්‍ය සහයෝගය ඉදිරියේදීත් ලබා දෙන බව ප්‍රකාශ කරමින් සියලු දෙනාටම 2023 සුභ නව වසරක් වේවා යි පතනවා. ස්තූතියි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි මේ 2022 වර්ෂයට අදාළ අවසාන මහ සභාව තමයි පවත්වනු ලැබුවේ. ඇතැම් විට මෙය මෙම ධූර කාලය තුළ අවසාන මහ සභාව වෙන්නත් පුළුවන්. සියලු දෙනාම අපි සමග එක්ව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සමග කටයුතු කළා වගේම මමත් මට හැකි උපරිමයෙන් ඔබතුමන්ලාගේ ඉල්ලීම් ඉටු කරදෙන්න කටයුතු කළා. එහිදී පක්ෂ විපක්ෂ භේද පිළිබඳ සැළකිලිමත් වුණේ නැහැ. අපි ඉදිරියේදී ඇතැම් විට හමුවුණා හෝ නොවුණත් 2023 වර්ෂය සියලුම දෙනාට සුභම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

## 10. - ස්තූතිය හා නිමාව.

අද දින 2022 වර්ෂයේ දෙසැම්බර් මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වූන අපේ හිටපු ගරු සභාපතිතුමන් , ගරු සභිකතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරිතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තුතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 02.00 ට පමණ සභා කොරමෝ සතුටින් විසිර ගියහ.

......................................

අයි. ජී. මහින්ද,

අයි.ජී.මහින්ද

සභාපති,

සභාපති

කටුවන ප්‍රාදේශීය සභාව

කටුවන ප්‍රාදේශීය සභාව

මිද්දෙනිය.